# ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය - 2010

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

-------------

### 1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 අවධාරණය කළ යුතු කරුණු

--------------------------

මාගේ මතය තත්ත්වාගණනය නොකරන නමුත් මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 7 කෙරේ අවධානය යොමු කරමි. සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.29,177,024 ක ඌනතාවයක් වූ අතර මෙම අවාසිදායක තත්ත්වය සමනය කිරීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් රු.30,472,838 ක් ලාභයට මාරුකර තිබුණි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------

#### 1.3.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව<br>------------------------------------------ | අනුකූල නොවීම<br>------------------- |
|---|---|
| (අ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්තායතන චක්‍රලේඛ අංක 6 හා 8 පරිච්ඡේද | |
| (i) 6.2.2 | අභ්‍යන්තර විගණන සේවා ලබාගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට දින 21 ක අවම කාල සීමාව වෙනුවට දින 08 ක කාලසීමාවක් පමණක් ලබාදී තිබුණි. |
| (ii) 8.9 | මණ්ඩලය සහ අභ්‍යන්තර විගණන සේවා සපයනු ලබන පෞද්ගලික විගණන සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 134(3) | මූල්‍ය මෙහෙයුම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි. |
| (ඇ) 1999 ජනවාරි 19 දින හා අංක පීඑෆ්පීර් 3 හා මුදල් රෙගුලාසි 134(2) | අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිවරයාගේ උපදෙස් විමසා නොතිබුණි. |

### 1.3.2 අවිධිමත් ගනුදෙනු

---------------------

භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව මණ්ඩලය විසින් පහත ගෙවීම් කර තිබුණි.

(අ). සේවකයන් සඳහා වර්ෂයක් තුළ වැටුප් වර්ධක එකකට වඩා ලබා දීම.

(ආ). උත්සව අත්තිකාරම් ලෙස රු.50,000 දක්වා ගෙවීම් කිරීම.

(ඇ). බාහිර වෛද්‍ය බිල්පත් රු.40,000 දක්වා ප්‍රතිපූර්ණය කිරීම.

2. **මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

------------------------------------

2.1 **මුල්‍ය සමාලෝචනය**

---------------------

2.1.1 **මුල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.29,177,024 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ඌනතාව රු.16,493,217ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,683,808 ක හෙවත් 76% ක පිරිහීමක් දක්නට ලැබුණි.

මෙම අවාසිදායක තත්ත්වය සමනය කිරීම සඳහා රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් රු.30,472,838 ක ලාභයට මාරු කර තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයේ රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කර තිබුණේ රු.17,126,937 ක් පමණි.

2.1.2 **විග්‍රහාත්මක සමාලෝචනය**

-----------------------------

ඉකුත් වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ මුළු ආදායම 14% කින් අඩු වී තිබුණු අතර මුළු වියදම 8.4%කින් වැඩි වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | **2010** | **2009** |
| | රු. | රු. |
| මුළු ආදායම | 42,306,073 | 49,404,521 |
| මුළු වියදම | (71,483,097) | (65,897,738) |
| බදු වලට පෙර ශුද්ධ ඌනතාවය | (29,177,024) | (16,493,217) |
| රක්ෂණ ඔප්පු හිමියන්ගේ ආරක්ෂණ අරමුදලින් මාරු කිරීම් | 30,472,838 | 17,126,937 |
| ආදායම් බදු | (1,295,814) | (633,720) |
| බදු වලට පසු ශුද්ධ අතිරික්තය/ඌනතාවය | - | - |

## 2.2 ආර්ථික නොවූ ගණුදෙනු

----------------------------

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ 11 වන මහලේ පිහිටුවා ඇති අතර ඒ සඳහා කුලී ලෙස 2008 වර්ෂයේ රු.18,245,106ක් ගෙවා තිබූ අතර 2010.ඔක්තෝම්බර් 01 සිට 2012.සැප්තැම්බර් 30 දක්වා රු.38,842,095 ක මුදලක් ගෙවීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණි.

22කට ආසන්න කාර්ය මණ්ඩලයක් සඳහා වර්ග අඩි 8741 භූමි ප්‍රමාණයක් වෙනුවෙන් එහි කුලිය, සේවා සඳහා සහ රථ ගාල් කිරීමේ ගාස්තු ලෙස අදාළ ගෙවීම් කර තබුණි.

2008 නොවැම්බර් 17 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දෙන ලද උපදෙස් ප්‍රකාරව කාර්යාල පරිශ්‍රය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය අඩු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩු පාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ප්‍රසම්පාදන

(ආ) අභ්‍යන්තර විගණනය

(ඇ) සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කිරීම.